# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1721/19 - 2011 අගෝස්තු 30 වැනි අඟහරුවාදා - 2011.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(viii)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මා විසින්, එකී පනතේ 70ඇ වගන්තිය යටතේ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරනු ලැබූ සමාගමක් වූ සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය (SAITM) සම්බන්ධයෙන් වූ වාර්තාවක් ලබාගෙන ඇති හෙයින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී (එම්බීබීඑස්) උපාධිය ප්‍රදානය කරනු ලබන ආයතනයක් වශයෙන් සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, (SAITM) මේ නියමය මගින් පිළිගනිමි.

**උපලේඛනය**

***අදාළ වන කොන්දේසි***

1. ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ උපාධි අපේක්ෂකයන් සඳහා වූ ශික්ෂණ ආයතනයන්හි විස්තෘත පීඨවල විශේෂඥයන් සැළකිල්ලට ගෙන උචිත ශිෂ්‍ය කාර්ය මණ්ඩල අනුපාතයක් පවත්වාගෙන යා යුතු ය.

2. (අ) නියම කරනු ලැබිය හැකි යම් පාරිභාෂිතයක් (Terminology) හා සම්බන්ධ යම් වෙනස් කිරීම් ද ඇතුළුව වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී උපාධි ප්‍රදානය සඳහා වූ පීඨය සහ අධ්‍යයන වැඩසටහන මගින් ශික්ෂණ කටයුතු ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන්;

   (ආ) පීඨයේම ශික්ෂණ රෝහල්වලදී හෝ වෙනත් යම් ශික්ෂණ රෝහල් සමඟ එකඟත්වයක් මගින් පීඨය විසින් සායනික පුහුණුව පැවැත්වීමට අදාළ පහසුකම් සැපයීම සම්බන්ධයෙන්;

   (ඇ) මෙම නියමය බලාත්මකවීමේ දින සිට මාස දහ අටක කාලයක් ඇතුළත මහාචාර්ය ඒකක පිහිටුවීම සම්බන්ධයෙන්,

   අඛණ්ඩ සහ බාධා රහිත පොරොන්දුවක් ලබා දිය යුතු ය.

3. ශිෂ්‍යයන් ඇතුළත් කිරීම්, ශිෂ්‍ය කටයුතු, අධ්‍යයන කටයුතු, රෝහල් හා වෙනත් සෞඛ්‍ය පහසුකම් සම්බන්ධතා, ව්‍යාපාර සහ සැළසුම් සම්බන්ධව වගකිවයුතු සහ අවස්ථාවෝචිත පරිදි වෙනත් පරිපාලන ක්‍රියාකාරකම් ඉටුකරනු ලැබිය යුතු ප්‍රමාණවත් පරිපාලන කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සහතික කරනු ලැබිය යුතු ය.

4. මෙම නියමය බලාත්මකවීමේ දින සිට එක් මාසයක කාලයක් ඇතුළත ආයතනික සමාලෝචන මණ්ඩලයේ නිර්දේශවලට අනුව (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත :

(අ) උචිත අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ පටිපාටි;
(ආ) වසර පහක් සඳහා සංස්ථා සැළැස්මේ අවසාන පිටපත; සහ
(ඇ) සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් (SAITM) ආයතනය හා සම්බන්ධ භාර ඔප්පුව,

ඉදිරිපත් කළ යුතු ය.

5. මෙම නියමය බලාත්මක වීමේ දින සිට මාස හයක් ඇතුළත මහාචාර්ය ඒකක ඉදිකිරීමේ කාර්යය සඳහා ඉදිකිරීම් ණයක් වශයෙන් රුපියල් මිලියන හයසියයක් (රුපියල් 600,000,000/-) ණයට ගැනීම සම්බන්ධයෙන් ලංකා බැංකුව විසින් නිකුත් කරන ලද අර්පන ලිපිය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

6. මෙම නියමය බලාත්මක වීමේ දින සිට එක් මාසයක කාලයත් ඇතුළත ප්‍රාග්ධන වියදම් අයවැය සඳහා වූ විධිවිධාන ද සමඟ නියම කරනු ලබන වෙනත් විස්තර සහිතව අවුරුදු පහක කාලයක් සඳහා මූල්‍ය සැළැස්ම සහ ස්වකීය අධ්‍යයන වැඩසටහන් නියමිත ලෙස ක්‍රියාත්මක වන බවට සහ පරිපාලනය වන බවට සහතික කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පත් ඇති බවට තහවුරු කිරීමේ සාධක කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

7. මෙම නියමය බලාත්මක වීමේ දින සිට මාස හයක කාලයක් ඇතුළත :

(i) දේශන ශාලා;
(ii) ශ්‍රවණාගාර හා විභාග ශාලා;
(iii) ශික්ෂක කාමර;
(iv) රසායනාගාර සහ කෞතුකාගාර - කාය ව්‍යවච්ඡේද, භෞත වේද, ජෛව රසායන, ක්ෂුද්‍ර ජීව, පරපෝෂවේද සහ ව්‍යාධිවේද යන අධ්‍යයන අංශ සඳහා ඕනෑම අවස්ථාවක දී මුලු ශිෂ්‍ය කණ්ඩායමෙන් තුනෙන් එකක් සමන්විත වන ශිෂ්‍යයන් ප්‍රමාණයක් සඳහා ඉඩ පහසුකම් සහ ඒ හා සමාන සංඛ්‍යාවක් සඳහා අන්වීක්ෂ භාවිත කරමින් අධ්‍යයන කටයුතු කළ හැකි රසායනාගාර සහිතව හෝ ඕනෑම අවස්ථාවක දී මුළු ශිෂ්‍ය කණ්ඩායම් සඳහා ඉඩ පහසුකම් සහ ඒ හා සමාන සංඛ්‍යාවක් සඳහා අන්වීක්ෂ සහිතව බහුවිෂය රසායනාගාර, කාය ව්‍යවච්ඡේද, භෞතවේද, ව්‍යාධිවේදී සහ අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශ සඳහා වෙන් වෙන් වශයෙන් හෝ සමූහ කෞතුකාගාරයක් තිබිය යුතු ය;
(v) ක්‍රීඩා සහ විනෝද කටයුතු සඳහා පහසුකම්;
(vi) පුස්තකාල;
(vii) තොරතුරු තාක්ෂණික පහසුකම්;
(viii) පර්යේෂණ පහසුකම්;
(ix) වෛද්‍ය අධ්‍යාපන ඒකක;
(x) කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි වෙනත් අදාළ පහසුකම්,

ඉදිකර සපයා දීම කරනු ලබන බවට සහතික විය යුතු ය.

8. මෙම නියමය බලාත්මක වන දින හෝ ඉන්පසු සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට (SAITM) ඇතුළත්වීමට අපේක්ෂා කරනු ලබන ශිෂ්‍යයන් සඳහා මෙම නියමය අදාළ විය යුතු ය

දිසානායක මුදියන්සේලාගේ
සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2011 ක් වූ අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

09-429

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.